# <u>පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය</u>

**AAT/102/2025 (PSC)**

ඊ.විජයන්ති නිමලා ද සිල්වා,
**අභියාචක**
**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.03.17**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ඒ.එම්.වන්සේකර මහතා,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, ජේ.එම්.දිසානායක මිය.

**-<u>නියෝගය</u>-**

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා**

ඊ.විජයන්ති නිමලා ද සිල්වා යන අභියාචක විසින් 2025.05.05 වෙනි දින, මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචන පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඇය වෙත පනවා ඇති විනය දඬුවම ඉවත් කර දෙන ලෙසයි. ඇයට පනවා ඇති විනය දඬුවම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂකගේ 2024.01.10 දිනැති ලිපියේ සඳහන්ව ඇත. එම ලිපියට අනුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති II සහ III චෝදනාවන්ට ඇය වරදකරු කර ඇති අතර, I වන චෝදනාවෙන් නිදහස් කර ඇත. එසේ II සහ III චෝදනාවන්ට අභියාචක වරදකරු කරමින් ඇයගේ වැටුප් වර්ධක එකක් අඩු කරමින්, විනය දඬුවම පනවා ඇත. එකී දඬුවමට එරෙහිව අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය සළකා බැලූ එම කොමිෂන් සභාව, 2025.04.03 දිනැතිව අභියාචක වෙත යවන ලද ලිපිය මගින්, එකී අභියාචනය ප්‍රතික්ෂේප කර ඇති බව සඳහන් කර ඇත. ඒ අනුව මෙහිදි සළකා බැලිය යුත්තේ අභියාචක වෙත ඉහතින් සඳහන් කර ඇති විනය නියෝගයේ සහ ඒ අනුව නිකුත් කර ඇති විනය දඬුවමේ නිරවද්‍යතාවයයි.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති පළවන චෝදනාවෙන් ඇය නිදහස් කර ඇති නිසා, ඒ සම්බන්ධයෙන් විමසා බැලීමක් අවශ්‍ය නොවේ. අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති II සහ III චෝදනාවන් පහත දැක්වේ.

II **ඔබ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2015/06/11 දිනැති දිවිනැගුම සහනාධාර චක්‍රලේඛන අංක 2015/06/01 හා/හෝ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2017/03.31 දිනැති දිවිනැගුම ගිණුම් චක්‍රලේඛන අංක 08/2017 හි උපදෙස් උල්ලංඝනය කිරීම.**

**III. ඔබ ඉහත අංක I සිට II දක්වා චෝදනාවන් හි සඳහන් වැරදි එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ සිදුකිරීම හේතුවෙන් ඔබගේ තනතුරත්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවත්, සමස්ථ රාජ්‍ය සේවයත් අපකීර්තියට පත්කිරීම.**

ඉහත කී II වන චෝදනාව පදනම් කරගෙන ඇත්තේ, 2015.06.11 දිනැති දිවිනැගුම සහනාධාර චක්‍රලේඛනයේ සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2017.03.31 දිනැති චක්‍රලේඛනය යටතේ වන උපදෙස් උල්ලංඝනය කිරීම යන හේතුව මතය. ඉහත කී චක්‍රලේඛන දෙක, විධිමත් විනය පරීක්ෂණයේ දි පැ.15 සහ පැ.17 ලෙසට සළකුණු කර සාක්ෂි ලෙසින් ඉදිරිපත් කර ඇත. එසේ නම් මෙහිදී තීරණය කළ යුතු වන්නේ, එම චක්‍රලේඛන උපදෙස් අනුව අභියාචක කටයුතු කර නොතිබේද යන්නයි.

පැ.15 දරණ චක්‍රලේඛනය මගින් දිවිනැගුම සහනාධාර වැඩ සටහන නව ක්‍රමවේදයක් යටතේ ක්‍රියාත්මක කිරීමේ දී, සමෘද්ධි සහනාධාර ගෙවිය යුතු ආකාරය පැහැදිලි කර ඇත. එකී පැ.15 දරණ චක්‍රලේඛනයේ 06 වන ජේදයේ සඳහන් කරුණු මෙම අභියාචනයට අදාළ වනවා ඇත. එහි සඳහන් වන්නේ ප්‍රතිලාභීන් මියයාම හෝ වෙනත් කරුණක් හේතුවෙන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව අඩුවුවහොත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරයයි. පැ.17 දරණ උපදෙස් මාලාවේ 1:4 (VI) ජේදයෙහි සඳහන් වන්නේ, ප්‍රතිලාභියා සම්බන්ධයෙන් දක්වා ඇති විස්තරයන්ට වන සංශෝධනයන්, සියළුම වසම් භාර නිලධාරීන් විසින් යාවත්කාලීන කළ යුතු බවයි.

මෙම අභියාචනයට අදාළ කරුණ වන්නේ, ඩබ්.රෝෂනී නදීකා සහ ජෝෂප් ලෙනාඩ් යන සහනාධාර ලාභීන්ගේ මුදල් ඔවුන්ගේ නමින් ගිණුම් ගත නොකර, පිළිවෙලින් ඒවා දූලිකා නිශාන්ති සහ ශානිකා ප්‍රියදර්ශනී

ප්‍රනාන්දු යන අයවළුන්ගේ ගිණුම් වලට බැර කර තිබීමයි. ඒ ආකාරයට අදාළ මුදල් වැරදි ලෙස ගිණුම් ගත කිරීම පිළිගෙන ඇති කරුණකි. ඒ අනුව මෙහිදී තීරණය කළ යුතු වන්නේ එසේ වැරදි සහගත ආකාරයෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් අභියාචකගේ සහභාගීත්වය කුමක් වී තිබුණේද යන්නයි.

ඉහත සඳහන් රෝෂනී නදීකා යන අය විදේශගතව ඇති බවත්, ජෝෂප් ලෙනාඩ් සිල්වා මියගොස් ඇති බවටත් සාක්ෂි ඉදිරිපත් කර ඇත. ඒ බව සනාථ කිරීම සඳහා අනෝමා දමයන්ති නමැති සාක්ෂිකාරිය විසින් පැහැදිලිව සාක්ෂි දී ඇත. ඇය, සිද්ධියට අදාළ මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කළමනාකරු ලෙස එවකට සේවය කර ඇති අතර, සාක්ෂි දෙන අවස්ථාව වනතෙක් ම ඇය එම තනතුරේ කටයුතු කර ඇත. ඒ බව පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාවේ 13 සහ 14 වන පිටුවල පැහැදිලිව සඳහන් කර ඇත. ඇය තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, ජෝෂප් ලෙනාඩ් සිල්වා යන අය 2010.03.01 දින මියගොස් ඇති බවයි. ඒ බව පැ.10 ලෙස ලකුණු කර ඇති ලේඛනයෙන් ද තහවුරු වන බවට ඇය සාක්ෂි දී ඇත.

කරුණු එසේ වුවත්, 2010 වර්ෂයේ සිටම ඉහත නම් සඳහන් ජෝෂප් ලෙනාඩ් සිල්වා යන අය වෙනුවෙන් ගෙවා ඇති සමෘද්ධි සහනාධාර ලබා ගෙන ඇත්තේ ශානිකා ප්‍රියදර්ශනී නැමැති අය විසිනි. එවැනි තත්ත්වයක් යටතේ මෙම වරද 2010 වර්ෂයේ සිටම පැවති එකක් බව පැහැදිලිව පෙනී යයි.

මූලික විමර්ශනයේ දි අභියාචක විසින් ලබා දී ඇති ප්‍රකාශයෙහි සඳහන් කර ඇත්තේ, ඇය මේ සිද්ධියට අදාළ වන මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කිරීම සඳහා පැමිණියේ 2015 පෙබරවාරි මස තුළදී බවයි. චෝදනාවන්හී සඳහන් වරද අභියාචක මෙම ස්ථානයේ සේවයට පැමිණීමට පෙර සිටම සිදුව ඇති බවට ස්ථිර සාක්ෂි ඇත. එම කරුණ විවාදයට ලක්වී නැත. එවැනි තත්ත්වයක් යටතේ පැහැදිලිව පෙනී යන්නේ, මෙම සිද්ධිය සිදුවී වර්ෂ 05කට වඩා අධික කාල පරිච්ඡේදයක් ගතවීමෙන් පසුව, අභියාචක මෙම ස්ථානයේ සේවයට වාර්තා කර ඇති බවයි.

මෙම වරද 2010 වර්ෂයේ සිටම සිදුවී ඇතත්, මෙම දෝෂය, 2015 වර්ෂය දක්වා එහි සේවය කළ විෂය භාර නිලධාරියාගේ හෝ කළමනාකරුගේ හෝ දැනුමට ලක්වී නැත. වගකිවයුතු නිලධාරීන් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් හෝ පවත්වා නැත. ඒ අනුව පෙනී යන්නේ, අභියාචක මෙහි සේවයට පැමිණෙන විටත් මෙම සිද්ධිය සිදුවී දීර්ඝ කාලයක්

ගතව ඇති නිසා, ඒ ගැන සොයා බලා වාර්තා ඉදිරිපත් කිරීමට එම කාල පරිච්ඡේදය තුළ රාජකාරියෙහි නියුතු නිලධාරීන් උනන්දු වී නොමැති බවයි.

තවද, මේ පිළිබඳ අදාළ ගෙවීම් සම්බන්ධයෙන් වන සම්පූර්ණ වගකීම පැවරී ඇත්තේ විෂය භාර නිලධාරියාට බව, සාක්ෂි ලෙස ඉදිරිපත් කරන ලද චක්‍රලේඛන වල සහ ඊට අමතරව ඉදිරිපත් කර ඇති සාක්ෂි මඟින් ද පැහැදිලිව පෙනී යයි. එකී කරුණුද සළකා බැලීමෙන් පසු, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා සියළුම චෝදනා වලින් ඇය නිදොස් කර නිදහස් කිරීමට තීරණය කර ඇත.

කෙසේ වෙතත්, අභියාචක විසින් මේ සම්බන්ධයෙන් ඇයගේ අවධානය යොමු කර නැත. සමෘද්ධි කළමනාකරු වශයෙන් ඇය දීර්ඝ කාලයක් සේවය කිරීම නිසා ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට ඇය වෙත ද වගකීමක් පැවරී ඇත.

ඉහත සඳහන් කරුණු අනුව පෙනී යන්නේ, අභියාචක විසින් ඇයගේ අවධානය යොමු කරමින් ගත යුතු ක්‍රියා මාර්ග සම්පූර්ණ කිරීම, අතපසු කර ඇති බවයි. ඒ අනුව චක්‍රලේඛනයේ උපදෙස් අනුව කටයුතු කර නොතිබීම යන චෝදනාවට අභියාචක වරදකරු කිරීමෙහි දෝෂයක් පෙනෙන්නට නැත. එම හේතුව මත දෙවන චෝදනාවට අභියාචක වරදකරු බවට ගෙන ඇති තීරණය කෙරෙහි මැදිහත් වීමට මෙම විනිශ්චය අධිකාරය අදහස් නොකරමු. ඒ අනුව දෙවන චෝදනාවට අභියාචක වරදකරු බවට පත්කර තිබීම හේතුවෙන්, ඇය 03 වෙනි චෝදනාවට ද ඒ මත වරදකරු බවට පත්වනවා ඇත.

කෙසේ වෙතත්, ඉහත සඳහන් කරුණු වලින් පැහැදිලිව පෙනී යන්නේ, මෙම සිද්ධිය සම්බන්ධයෙන් අභියාචක සතුවූ වගකීම ඉතාමත් අල්පවූ බවයි. එවැනි තත්ත්වයක් යටතේ අභියාචකට එරෙහිව පනවා ඇති දඬුවම බරපතල එකක් වන බව පෙනී යයි. මෙම දඬුවම හේතුවෙන් ඇයගේ උසස්වීම් වලට ද, එය දැඩි ලෙස බලපානවා ඇත.

එම කරුණු සළකා බලා, අභියාචකගේ වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමට පනවා ඇති දඬුවම ඉවත් කර, ඒ වෙනුවට ආයතන සංග්‍රහයේ දෙවන වෙළුමේ, XLVIII පරිච්ඡේදයේ 24:2 යටතේ වන සුළු දඬුවමක් ලෙස සඳහන් "**අවවාද කිරීම**" යන දඬුවම ආදේශ කිරීමට තීරණය කරමු.

මෙම අවවාද කිරීම, දඬුවමක් නොවිය යුතු බවට එකී වගන්තියේ පැහැදිලිව සඳහන් වේ. එබැවින් මෙම දඬුවම ආයතන සංග්‍රහයේ දෙවන

උපලේඛනයට ඇතුළත් වන වරදක් ලෙසට සළකා ක්‍රියා කළ යුතු බවට තව දුරටත් තීරණය කරමු.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචකගේ අභියාචනයට අවසර දෙමු.

අභියාචනයට අවසර ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-